**සටහන :** ඉහත තනතුර සඳහා පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ දැනුම ලබා තිබිය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමය** : ලිඛිත තරඟ විභාගයක් හා / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**02.** **සේවා ගණය** : ආශ්‍රිත නිලධාරී (MA 3)

**වැටුප් පරිමාණය** : MA 3 - 2016 : රු:32,200–10x445-11x660-10x730-05x750-54,960/= (මාසික)

**වයස** : අවු:22ට නො අඩු හා අවු:45ට නො වැඩි අය විය යුතුය. (අභ්‍යන්තර අයදුම් කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**02.1 පුස්තකාල සංවර්ධන සහකාර iii ශ්‍රේණිය (පුරප්පාඩු 05)**

**සුදුසුකම් :**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.
2. පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ දැනුම ලබා තිබීම.

**බඳවා ගැනීමේ ක්‍රමය** : ලිඛිත තරඟ විභාගයක් හා / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

03. **සේවා ගණය** : කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණය (MA 2 – 1)

**වැටුප් පරිමාණය** : MA 2-1-2016 රු:30,310-10x300-07x350-04x495-20x660-50,940/=(මාසික)

**වයස** : අවු:18ට නො අඩු හා අවු:35ට නො වැඩි අය විය යුතුය. (අභ්‍යන්තර අයදුම් කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**03.1 තොරතුරු තාක්ෂණ සහකාර iii ශ්‍රේණිය (පුරප්පාඩු 01)**

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

**අධ්‍යාපන**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී

i. සිංහල / දෙමළ භාෂාව

ii. ගණිතය

iii. විද්‍යාව

iv. ඉංග්‍රීසි භාෂාව යන විෂයන්ට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී භෞතික විද්‍යාව විෂයය සහිතව විෂයයන් තුන(03)කින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වීම.

(ඇ) පරිගණක වැඩසටහන් සම්පාදනය / තොරතුරු තාක්ෂණය පිළිබඳව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළි ගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනය

